**මිහින්තලය ප්‍රාදේශීය සභාව - 2020**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 අහිතකර මතය**
**---------------**

මිහින්තලය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, 2020 දෙසැම්බර් 31 දිනට මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**
**---------------------------------**

මෙම වාර්තාවේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ අහිතකර විගණන මතය ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මාර්ග, පාලම් හා බෝක්කු ඉදිකර තිබුණු නමුත් එම ස්ථාවර වත්කම්වලට අදාළ ඵලදායී ජීවකාලය හෝ ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි. | වත්කම් ක්ෂය කරන ප්‍රතිපත්තිය, ඵලදායී ජීවකාලය හෝ ක්ෂය අනුපාතය කුමක්ද යන්න හෙළිදරව් කළයුතු වේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් පොතට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ පොදු මුදල් ගිණුමේ හා කර්මාන්ත මුදල් ගිණුමේ ශේෂ පිළිවෙලින් රු.562,164 ක් හා රු.839,676 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් එය රු.2,275,722 ක් හා රු.2,408,483 ක් ලෙස රු.3,282,365 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශන තුළින් මුදල් ශේෂයේ නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියට අදාළව සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට ලැබුණු රු.2,773,300 ක් සභාව සතු ජංගම ගිණුමක තැන්පත් කර තිබුණු නමුත් එය ජංගම වත්කම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා සභාවේ මුදල් ශේෂය රු.2,773,300 කින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | සභාව සතු වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළයුතු වේ. |
| (ඇ) | දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවූ පොලී රු.143,489 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි පොලී වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කළයුතු වේ. |
| (ඈ) | සභාව සතු රු.4,500,000 ක වූ ස්ථාවර තැන්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු.58,836 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.247,500 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් රු.188,664 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | ලැබිය යුතු නිවැරදි පොලී ආදායම වත්කම් වගකීම් ප්‍රකාශයේ ගිණුම්ගත කළයුතු වේ. |
| (ඉ) | නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 09 ක් බදුදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලබාගත් රු.4,500,000 ක ඇප තැන්පත් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ ගෙවිය යුතු දෑ ලෙස ගිණුම්ගත නොකිරීම නිසා සභාවේ වගකීම් රු.4,500,000 ක් අඩුවී තිබුණි. | පිළිගනිමි. | ගෙවිය යුතු ඇප තැන්පත් ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කළයුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ලාභය ගැලපූ පසු 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු.274,652,431 ක් වියයුතු වුවත් වත්කම් වගකීම් ප්‍රකාශයේ එය රු.17,462,493 ක් ලෙස දැක්වීම නිසා සභාවේ මුළු හිමිකම රු.257,189,938 කින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | සමුච්චිත අරමුදල් ගිණුම් නිවැරදි ශේෂය වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දැක්විය යුතුවේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදානය රු.9,136,730 ක් වුවත් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ එය රු.251,621,181 ක් ලෙස දැක්වීම නිසා සභාවේ හිමිකම රු.242,484,451 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් සභාව විසින් වෙන්කිරීමක් කර ගිණුම්ගත නොකිරීම නිසා සභාවේ වියදම් හා ගෙවිය යුතු වියදම් එම වටිනාකමින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | සභාවේ වියදම් සහ ගෙවිය යුතු වියදම් වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (එ) | ආදායම් ලේඛන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු පුනරාවර්තන වියදම් ප්‍රදානය රු.49,079,130 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එය රු.20,276,320 ක් ලෙස දැක්වීම නිසා වර්ෂයේ ලාභය රු.28,802,810 කින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | විස්තීරණ ආදායම් ප්‍රකාශයේ නිවැරදි පුනරාවර්තන වියදම ප්‍රදාන වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.679,212 ක විශ්‍රාම වැටුප් ගෙවිය යුතු දෑ ලෙස වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා නොතිබීම නිසා සභාවේ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | පිළිගනිමි. | ගෙවිය යුතු සියළුම වියදම හඳුනාගෙන එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළයුතු වේ. |
| (ඔ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය රු.6,249,600 ක් වුවත් එය සමුච්චිත අරමුදලට ගැලපීමේදී රු.5,104,742 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමුච්චිත අරමුදල රු.1,144,858 කින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ලාභ/ අලාභ වටිනාකම සමුච්චිත අරමුදලට ගැලපිය යුතුවේ. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ දිගු කාලීන ණය වාරික ගෙවීම් රු.601,767 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.1,382,475 ක් ලෙස දක්වා තිබීම නිසා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.1,984,242 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | ණය වාරික මුදලින් ගෙවීම් මුදල් ගලායාමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුවේ. |
| (ක) | සමාලෝචිත වර්ෂයේදී රු.4,500,000 ක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණු නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය ආයෝජන ක්‍රියාකාරකම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය තුළ ශුද්ධ මුදල් වැඩිවීම එම වටිනාකමෙන් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | ස්ථාවර තැන්පත්වල ආයෝජන කිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ග) | මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් සමාලෝචිත වර්ෂයේදී සිදුවූ ශුද්ධ මුදල් වැඩිවීම රු.41,555,410 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.3,767,040 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ශුද්ධ මුදල් වැඩිවීම රු.37,788,370 කින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (ච) | ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද මාර්ග, පාලම් සහ බෝක්කුවල වටිනාකම රු.9,136,730 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.2,000,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර වත්කම් රු.7,136,730 කින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ස්ථාවර වත්කම් වටිනාකම් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දැක්විය යුතුවේ. |
| (ජ) | සභාව වෙත ලැබුණු කසළ ඇඹරුම් යන්ත්‍රයක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.500,000 ක් ගෙවීම් කර තිබුණු නමුත් එය වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | සභාවට අයත් සියළු ස්ථාවර වත්කම් පිළිබඳව වත්කම් සහ වගකීම් ප්‍රකාශයෙන් හෙළිදරව් කළයුතු වේ. |
| (ට) | හික්කඩුව ප්‍රාදේශීය සභාවට කසළ ඇඹරුම් යන්ත්‍රයක් සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සභාවට ලැබුණු රු.1,000,000 ක් තැන්පතු ලෙස ගිණුම්ගත නොකර වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩිවී තිබුණු අතර තැන්පත් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | තෙවන පාර්ශවයක් වෙත ගෙවිය යුතු මුදල් තැන්පත් ලෙස පමණක් ගිණුම්ගත කළයුතු වේ. |
| (ඩ) | සභාව සතු වටිනාකම රු.1,692,500 ක් වූ ජල බවුසර් රථය හා ට්‍රේලර් 04 ක් ගිණුම්වලට ඇතුළත් නොකිරීම නිසා සභාවේ ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් අඩුවී තිබුණි. | පිළිගනිමි. | සියළුම ස්ථාවර වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළයුතු වේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.47,623,694 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,249,600 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,650,387 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

(අ) කුලී

| | | |
|---|---|---|
| සභාවට අයත් කඩ කාමර 64 ක් වෙනුවෙන් 2018 වර්ෂයේ සිට අයනොවී පවතින හිඟ කුලී ආදායම රු.5,214,950 ක්වූ අතර එම මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ සිට අයනොවී පවතින කඩකුලී අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | කඩකුලී ගෙවීම් පැහැර හැර ඇති බැවින් හිඟ කඩකුලී අයකර ගැනීමට කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

(ආ) බලපත්‍ර ගාස්තු

| | | |
|---|---|---|
| හිඟ ආදායම් සම්බන්ධව ලේඛන පවත්වා ගැනීම සිදුකර නොතිබුණු අතර රු.375,865 ක හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ආදායම් හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

(ඇ) වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.274,025 ක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සිහිකැඳවීම් ලිපි යවා ඇත. | වෙනත් ආදායම් ලබාගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 සහ 2020 වර්ෂවලදී බැකෝලෝඩර, ගලි බවුසර හා ජල බවුසර කුලියටදීම වෙනුවෙන් බාහිර පාර්ශවයන්ගෙන් සභාවට අයවිය යුතු රු.402,300 ක් අයකරගෙන නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා අදාළ පාර්ශව වෙත ලිඛිතව දන්වා ඇත. | අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මිහින්තලය පුස්තකාලය හා ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රු.3,958,710 ක ණය මුදලක් ලබාගැනීම වෙනුවෙන් වූ රු.50,150 ක ණය වාරිකයක් මාසිකව ගෙවමින් පැවති නමුත් එම ශ්‍රවණාගාරය ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. | කුමන හෝ ව්‍යාපෘතියක් යටතේ ඉහළ මාලය සංචාරක නිකේතනයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂාවෙන් සිටිමි. | ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන්කර භාවිතයට ගැනීමට පියවරගත යුතුවේ. |
| (ආ) | සභා බලප්‍රදේශයට අයත් පලුගස්වැව හා 5 ඇල උක්කුලංකුලම ප්‍රදේශ දෙකෙහි RO ජල පෙරන යන්ත්‍ර 02 ක් සවිකිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකර ඒ සඳහා 2019 වර්ෂයේදී රු.2,836,523 ක් ගෙවීම් කර තිබුණු නමුත් එම වත්කම් සභාවේ වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | පිළිගනිමි. | වත්කම් ස්වරූපයේ වියදම් හඳුනාගෙන ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුවේ. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කසළ බැහැර කිරීමට නිශ්චිත ස්ථානයක් නොමැති බව දක්වමින් ප්‍රාදේශීය සභාව කසළ එකතු කිරීම නවතා ඇති අතර බලප්‍රදේශයේ ජනනය වන කසළ අවිධිමත් ආකාරයෙන් කැලෑබද පරිසරයට මුදාහරිමින් පැවතුණි. | මේ සඳහා ඉඩමක් ලැබී ඇති අතර ප්‍රතිපාදන ලද පසු එහි කටයුතු ආරම්භ කරමි. | කසළ විධිමත් ලෙස බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |